# බේකරි මහත්තයා



එච්.එම්.රනුදි රමල්යා බණ්ඩාර හේරත්

# බේකරි මහත්තයා

**2025**

**කතෘ ප්‍රකාශනයකි**



**කථාව සහ චිත්‍ර - එච්.එම්.රනුදි රමල්යා බණ්ඩාර හේරත්**

**පාසල - මහාමායා බාලිකා විද්‍යාලය/මහනුවර**

**කතෘගේ වෙනත් කෘති- •අරුම පුදුම කඟවේනා**

**•අසරණ ගැහැණු ළමයා**

ISBN: 978-624-208-193-9

**පිදුම**

මා සෙනෙහසින් හැදූ වැඩූ
මාගේ ආදරණීය
අම්මාටත්,අප්පච්චිටත්,

මා වෙත සෙනෙහසින්
අකුරු කරවූ ආදරණීය ගුරු
මව්පියවරුන්ටත්,

මාගේ ආදරණීය මහාමායා
විදුහල් මාතාවටත්,

සෙනෙහසින් පුදමි......!

පෙර වදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපීපෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්තකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්තකරණයට යොමු කරන “**හෙරණගත්තරණි**” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි.ජීවිතේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# බේකරි මහත්තයා

එකමත් එක පුංචි ගමක බේකරි මහත්තයෙක් සිටියා. එයා රසට කේක් හදනවා. එයාගේ කඩෙන් හැමෝම කේක් ගත්තා.




ඉතින්, එක මාමා කෙනෙක් හැමදාම බේකරි මහත්තයාගෙන් කේක් ගන්න ආවා.



ඒ මාමා හැමදාම කේක් අරන් යන දිහා හොරෙක් බලන් සිටියා. බේකරි මහත්තයා ගේ වෙළදාම හොඳට කෙරීගෙන යනවා... හොරා සිතුවා. ඉතින් එයා එක දවසක් බේකරියට ගිහින් බේකරි මහත්තයාට මෙහෙම කිව්වා. ඔයා හැමෝටම රස කෑම හදලා දෙනවානේ,

ඒත් ඔයා මේ කෑම වලට මම ළඟ තියෙන මේ රස දේවල් එකතු කළොත් කේක් ගොඩක් රස වෙයි, හොරා කිව්වා. බේකරි මහත්තයා හොරා කිව්ව දේ අහලා ඒවා කේක් වලට එකතු කළා.




එයා හොරෙක් කියලා බේකරි මහත්තයා නම් දැනගෙන සිටියේ නැහැ.

ඔන්න හැමදාම කේක් ගන්න මාමා බේකරියට අවා. ඒ මාමා කේක් ගෙඩියක් මිලදී ගත්තා. ඉතින් එයා කිව්වා ඔයාගෙ කේක් අද රස නැනේ කියලා. බේකරි මහත්තයා කිව්වා මගේ කේක්

රසම රසයි කියලා. ඔන්න ඉතින් බේකරි මහත්තයාගේ කේක් රස නැති නිසා එයාගේ කේක් කවුරුත් ගත්තේ නැහැ. ඒනිසා එයාගේ ව්‍යාපාරය කඩාගෙන වැටුණා.



බේකරි මහත්තයා දවල් රෑ නොබලා කල්පනා කළා.




බේකරි මහත්තයාට එයාගෙ කෑම වලට විෂ දාන්න කිව්ව කෙනා හොරෙක් කියලා බේකරි මහත්තයා දැන ගත්තා.

බේකරි මහත්තයට දුක හිතුණා. එයා සිතුවා මම හොරා කිව්ව දේවල් අහපු නිසානේ මගේ බේකරිය කඩාගෙන වැටුණේ කියලා.

එයාට මම හොඳ පාඩමක් උගන්නනවා. බේකරි මහත්තයා සිතුවා.




එහෙම සිතුව බේකරි මහත්තයා ආයෙත් කේක් හදන්න පටන් ගත්තා.



හොරාට හරිම පුදුමයි. මොකද,බේකරි මහත්තයගේ කෑම ගන්න ගොඩක් අය එනවා එයා දැක්කා. හොරා බේකරි මහත්තයා ලඟට ආවා. ඇවිත් මෙහෙම ඇහුවා “ඔයා දැන් කෑම වලට මම දුන්න දේවල් දාන්නේ නැද්ද?

මම තවත් ඔයා කියන දෙවල් අහන්නේ නැහැ.

ඇයි ඔයා අහිංසක මිනිසුන්ට කරදර කරන්නේ,බේකරි මහත්තයා ඇහුවා. මම හොරෙක් මගේ වැඩේ අනිත් අයට කරදර කරන එක. හොරා කිව්වා. අහිංසක මිනිස්සුන්ට කරදර කරනවට ඔයාට හොඳ පාඩමක් උගන්නන්න ඕනේ,බේකරි මහත්තයා කිව්වා.



ඔයා ආයෙත් මිනිස්සුන්ට කරදර කරන්න එපා කියලා අවවාද කළා. තවදුරටත් එයා හොරෙක් වුණේ නැහැ. බේකරි මහත්තයා එයාව බේකරියේ වැඩට ගත්තා. එයාගේ නම තමයි සේතුං. බේකරි මහත්තයා සේතුං එක්ක එකතු වෙලා බේකරිය දියුණු කළා. හැමෝටම ගොඩාක් සතුටුයි.



නිමි.

“මේ කතන්දරයෙන් පුංචි අපිට ලැබෙන ආදර්ශය තමයි නරක කෙනෙකුට උනත් යහමඟ පෙන්වා දෙමින් යහපත් මාර්ගයට ගත හැකි බව”





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාතමක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණට කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ එළදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘති මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි.මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුල්පතිතුමිය ,දියණියක්,ගුරුභවතුන්,දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි.තම නිර්මාණ ජත්‍යාන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනඟා දී තිබේ.තම නිසඟ,සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN: 978-624-208-193-9